# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/13 - 2017 දෙසැම්බර් මස 04 වැනි සඳුදා - 2017.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ රත්තොට ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1333.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාඋස්සාගොල්ල ග්‍රාම නිලධාරි වසමේ වෙලන්ගහවත්ත ගමේ අස්සැද්දුමේ වත්ත තැන්නේයාය වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 01 ක් රූඩ් 03 පර්චස් 05.75 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | වෙලංගහවත්ත සිට රත්තොට දක්වා වැටී ඇති මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය) ; |
| *නැගෙනහිරට* | : | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය ; |
| *දකුණට* | : | ඩී. ඒ. ජී. හේමලතා හිමිකම් කියන අංක 18 සැළසුමේ කැබලි අංක 02 න් කොටසක් හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | ඩී. ඒ. ජී. එම්. සෙනෙවිරත්න හිමිකම් කියන අංක 18 සැළසුමේ කැබලි අංක 02 න් කොටසක් හා මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* :

01. ඩබ්. පාලිත ගුණරත්න මහතා,
දික්කුඹුර - රත්තොට.

02. එච්. එම්. එල්. කේ. හේරත් මහතා,
දික්කුඹුර - රත්තොට.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

03. ඩී. ඒ. ජී. පී. සමරනායක මහතා,
අංක 71, මාළුස්සාගොල්ල.

04. ඩී. ඒ. ජී. හේමලතා මිය,
දික්කුඹුර - රත්තොට.

12 - 587

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.